මගේ අංකය :- 23/3/5
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
මුතුකණ්ඩිය ව්‍යාපාරය
සියඹලාණ්ඩුව
2017.08.25

මුතුකණ්ඩිය ව්‍යාපාරයේ
ව්‍යාපාර කමිටු සාමාජික මහත්ම/මහත්මීන් වෙත,

<u>ව්‍යාපාර කමිටු රැස්වීම් වාර්තාව - 2017 අගෝස්තු මාසය.</u>

මුතුකණ්ඩිය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කමිටු රැස්වීම 2017.08.24 දින පෙ:ව:9.30 ට මුතුකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවැත්විය.

සහභාගී වූ නිලධාරීන් :-

| | |
|---|---|
| 01. L.සරත් පෙමිසිරි සිල්වා මහතා | - නේවාසික ව්‍යාපාර කළමනාකරු,මුතුකණ්ඩිය |
| 02. I.L.නවශාඩ් මහතා | - ස්ථානභාර කෘෂිකර්ම උපදේශක,සියඹලාණ්ඩුව |
| 03. S.M.I.මධුරංග මහතා | - ඉංජිනේරු සහකාර,වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 04. H.M.අසංක නුවන් ප්‍රසන්න මහතා | - තාක්ෂණ සහකාර, වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 05.T.M.M.Y.බංඩාර මහතා | - සංවර්ධන නිලධාරී, වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 06. R.M.පියරත්න මහතා | - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ:කාර්යාලය |
| 07. K.M.W.උදය කුමාර මහතා | - සංවර්ධන නිලධාරී,ව්‍යා.කළ:කාර්යාලය |

සහභාගී වූ ගොවිසංවිධාන නියෝජිත වරුන් :-

| | |
|---|---|
| 01. H.M.ආරියදාස මහතා | - භාණ්ඩාගාරික,රණරයුර ගො.සං. |
| 02. D.පාලිත උඩවත්ත මහතා | - සභාපති,ගැමුණු ගො.සං. |
| 03. R.M.මුතුබණ්ඩා මහතා | - සභාපති,විජිතපුර ගො.සං. |
| 04. D.M.ගුණසේකර මහතා | - සභාපති,රණමයුර ගො.සං. |
| 05. W.M.සුදුබණ්ඩා මහතා | - භාණ්ඩාගාරික,එක්සත් ගො.සං. |
| 06. R.M.රත්නායක මහතා | - සභාපති,එකමුතු ගො.සං. |
| 07. R.M.ජිනදාස මහතා | - ලේකම්,රණමයුර ගො.සං. |
| 08. B.G.අප්පුහාමි මහතා | - සභාපති,අතුරුභෝග,වියලි ගොවිපල |
| 09. P.A.S.කුමාර මහතා | - ලේකම්,විජිතපුර ගො.සං. |
| 10. J.M.S.ජයවර්ධන මිය | - භාණ්ඩාගාරික,ගැමුණු ගො.සං. |
| 11. T.W.විමලාවති මිය | - භාණ්ඩාගාරික,එකමුතු ගො.සං. |
| 12. A.L.චන්ද්‍රසිරි මහතා | - සභාපති,එක්සත් ගො.සං. |
| 13. J.M.N.කරුණාතිලක මහතා | - ලේකම්,සිරිපැරකුම් ගො.සං. |
| 14. R.I.V.රාමනායක මහතා | - ලේකම්,එකමුතු ගො.සං. |
| 15. L.සනත් චන්ද්‍ර මහතා | - ගොවි නියෝජිත,රණමයුර ගො.සං. |
| 16. D.M.සුධර්මා පුෂ්ප කාන්ති මිය | - සභාපති,කාන්තා ගො.සං. |
| 17. H.M.කපිල සිරි මහතා | - ගොවි නියෝජිත,එක්සත් ගො.සං. |

සහභාගී වූ ජල පාලක වරුන් :-

| | |
|---|---|
| 01. D.M.නිමල් දිසානායක මහතා | - ජල පාලක වාරිමාර්ග දෙපා: |
| 02. R.M.ධම්මික පද්මසිරි මහතා | - ජල පාලක වාරිමාර්ග දෙපා: |

• <u>පිළිගැනීම හා අරමුණු පැහැදිලි කිරීම :-</u>

ආගම සිහි කිරීමෙන් අනතුරුව පැමිණ සිටි නිලධාරීන් හා ගොවි නියෝජිත වරුන් සියලු දෙනා ව්‍යාපාර කළමනාකරු විසින් පිළිගන්නා ලදී. අරමුණු පැහැදිලි කරමින් ව්‍යාපාර කළමනාකරු ප්‍රකාශ කර සිටියේ 2017 යල කන්න රැස්වීමේ තීරණ සහ නියමිත දිනෙන් පසු ජල දිගුවක් අවශ්‍ය වේද යන්නත්,

ඔක්තෝබර් 01 දිනට යෙදී ඇති දළදා මාලිගාවේ පැවැත්වෙන යල් අස්වනු පූජාවට සූදානම් වීමත්, වාපි සගරාව සැකසීම, කාන්තා අනු කමිටු සංවර්ධනය කිරීම ආදී කරුණු පිළිබඳ සාකච්ඡා කර තීන්දු තීරණ ගැනීම අද දින දින රැස්වීමේදී කළ යුතුව ඇති බවයි.

පසුගිය රැස්වීමේ වාර්තාව සාකච්ඡා කර ,සත්‍ය වාර්තාවක් ලෙස ගැමුණු ගොවි සංවිධානයේ සභාපති පාලිත උඩවත්ත මහතා කළ යෝජනාව රණමයුර ගො.සං.සභාපති ඩී.එම්.ගුණසේකර මහතා ස්ථිර කරන ලදි.

| අනු අංක | විෂය ක්ෂේත්‍රය | සාකච්ඡා කල කරුණු / ගණු ලැබූ තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | ආයතන සංවර්ධනය | 2017.08.31 දින ගිණුම් පුහුණු වැඩසටහන ගොවි නායකයින් සඳහා පැවැත්වීමට තීරණය විය | නේ:ව්‍යා:කළමනාකරු, සං.නිලධාරීන් ගොවිසංවිධාන |
| | | කාන්තා අනු කමිටු සඳහා වෙනම බැංකු ගිණුම් විවෘත කිරීම. | කාන්තා අනු කමිටුව |
| | | ගොවින්ගෙන් ලබාගන්නා නඩත්තු අර මුදල් සඳහා වෙනම බැංකු ගිණුම් ආරම්භ කිරීම, ගොවිසංවිධාන මට්ටමින් කලහැකි නඩත්තු කටයුතු සිදුකර ගැනීම. කෘෂි පාරවල් සැකසීම, බෙදුම් ඇල නඩත්තු කිරීම, ආදර්ශ නාම පුවරු සවි කිරීම, කෙත්ඇල රක්ෂිත වෙන්කර මායිම් ගල් දැමීම ආදිය. | නේ:ව්‍යා:කළමනාකරු, සං.නිලධාරීන් ගොවිසංවිධාන |
| | | DC 4 ඇලේ රක්ෂිතය වෙන්කිරීම, ආදර්ශ නාම පුවරුවක් සවි කිරීම 2017.09.06 දිනට යොදා ගන්නා ලදී. | අදාල ගොවිසංවිධානය |
| 02 | මෙහෙයුම් හා නඩත්තු කටයුතු | අදහස් දැක්වීම - ඉංජිනේරු සහකාර<br>ඉදිරි පුණරුත්ථාපනයට තෝරාගෙන ඇති ඇලවල් ලෙස ගම්මාන 3 හි FC 19, 19 S-1 , FC 20, FC 21, FC 23, 23 S-1 ලෙස සඳහන් කරන ලදී.<br>මෙවර වගා කන්නය සඳහා පෙර කන්න වලට වඩා අවම ජල ප්‍රමාණයක් වැයවී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. | |
| | වැරිමාර්ග ගැටලු | FC 49 ඇලේ ඉදිකිරීම් කටයුතු නිසි අයුරින් සිදු නොවන බව ගොවි නියෝජිත පොලමන් අප්පුහාමි මහතා ප්‍රකාශ කරන ලදී. ඒ පිළිබඳව එහි කොන්ත්‍රාත් කරුවන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.<br>ඒ පිළිබඳව අදාල කොන්ත්‍රාත් කරු දැනුවත් කිරීමට කටයුතු කරන බව ඉංජිනේරු සහකාර මහතා පැවසිය. | ඉංජිනේරු සහකාර |
| | | හැඩඹයේ වැලි ගොඩ දැමීම නිසා FC 24 ඇල හැඩඹයට කඩාගෙන යන බව රණමයුර ගො.සං.නිටපු භාණ්ඩාගාරික එල්.සනත් චන්ද්‍ර මහතා ප්‍රකාශ කරන ලදී. | පරීක්ෂා කර බැලීම නේ.ව්‍යා.කළමනාකරු සංවර්ධන නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| 03 | 2017 යල් කන්නයේ වගාවේ තත්වය | කන්න රැස්වීමේදී තීරණය කර ගන්නා ලද ජලය ලබාදීමේ අවසන් දිනය 2017. 08.28 දින ජලය නතර කිරීමේදී තව දුරටත් ජලය අවශ්‍ය වන ගම්මාන පිළිබඳ විමසන ලදී.<br>අදහස් දැක්වීම -<br>ගම්මාන 01 ගො.සං. - 90 % පමණ ජලය අවශ්‍ය නොවන බව පැවසීය.<br>ගම්මාන 02 ගො.සං. – 20 % පමණ ජලය අවශ්‍යයි.<br>ගම්මාන 03 ගො.සං. - සභාපති , ජලය අවශ්‍ය නොවේ. එහෙත් දැඩි නියං තත්වයක් පැවතියහොත් අගෝස්තු 28 දින ජලය නතර කර සැප්තැම්බර් 05 පමණ ජල මුරයක් ලබාදිම යෝජනා කරමි.<br>ගම්මාන 05 ගො.ස. – 80 % පමණ ජලය අවශ්‍යයි.<br>ගම්මාන 06 ගො.සං. - ජලය අවශ්‍ය නොවේ දැනට 40 % පමණ අස්වැන්න නෙලා අවසන් කර ඇත. | ඉදිරියේදී වර්ෂාවක් නොලැබුනහොත් ජල මුරයක් ලබාදීමට කමිටුව එකග විය |
| 04 | විශේෂ වැඩසටහන් | 2017 ඔක්තෝබර් මස 01 දින ශ්‍රී දළදා මාලිගාවේ පැවැත්වීමට නියමිත යල් අස්වනු පූජාව සඳහා මුතුකණ්ඩිය ගොවිසංවිධාන සාමාජිකයන්ට යාම සඳහා ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට වාරිමාර්ග අමාත්‍යාංශයෙන් බස් රථයක් ලබාගැනීමට ඇමති තුමාගෙන් ඉල්ලීමක් කිරීමට හා එය නොලැබුනහොත් ගොවි සංවිධාන අරමුදලින් ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට ගොවි නියෝජිතයන්ගේ එකගත්වය පලවිය.<br><br>ගම්මාන මට්ටමින් වගකීම බෙදා ගැනීම - පූජා භාණ්ඩ එකතු කිරීම (අලුත් සහල්,වී කරල්,ධාන්‍ය වර්ග,)<br>ගම්මාන 01 - සභාපති ආර්.එම්.රත්නායක මහතා<br>ගම්මාන 02 - සභාපති පාලිත උඩවත්ත මහතා<br>ගම්මාන 03 - භාණ්ඩාගාරික එච්.එම්.ආරියදාස මහතා<br>ගම්මාන 04 - ලේකම් නිමල් කරුණාතිලක මහතා<br>ගම්මාන 05 - භාණ්ඩාගාරික ඩබ්.එම්.සුදුබණ්ඩා මහතා<br>ගම්මාන 06 - සභාපති ආර්.එම්.මුතුබංඩා මහතා<br>වියලි ගොවිපල සමනල බැද්ද - දිමුතු මානෙල් මිය<br>විපලි ගොවිපල යක්කදුරාව - බී.ජී.අප්පුහාමි මහතා | ඒකාබද්ධ ගො.සං.සභාපති සහ ගොවි සංවිධාන නිලධාරීන් |

| | | | |
|---|---|---|---|
| 05 | කෘෂිකර්ම සංවර්ධනය | අදහස් දැක්වීම - ස්ථානාභාර කෘෂිකර්ම උපදේශක<br>මයිටා හානිය, කොපු අංග මාරය,වැනි රෝග පිලිබඳව පැහැදිලි කරන ලදී. කුඹුරේ නියර වල වල් මර්ධනය කර පවත්වා ගැනීම තුලින් රෝග වලක්වා ගැනීමේ හැකියාව පැහැදිලි කරන ලදී. මෙම කන්නයේ වල් මර්ධනය සඳහා ගොවින් භාවිතා කල (ඇට බෙහෙත්) පිට්ලැක්ලෝර් වල් නාශකය ඇතැම් කුඹුරුවල වල් මර්ධනය වි නොමැති බව වාර්තා වී ඇත. මෙම වල් නාශකය යොදන අවස්ථාවේ කුඹුරේ තෙතමනය තිබිය යුතු අතර, එම තෙතමනය ස්ථරයක් ආරකාරයෙන් පවත්වා ගැනීම වැදගත්වේ. වැලි සහිත කුඹුරු වල වියලි බව හේතුවෙන් ඉහත වල් නාශකය ක්‍රියාත්මක නොවේ.<br><br>ලියද්ද මට්ටමට නොතිබීමත්, බිම සැකසීමට අඩු කාලයක් යොදා ගැනීමත් වගාවේ වල් මර්ධනය නොවීමට බලපා ඇති බව සාකච්ඡා විය.<br><br>ඉදිරි මහ කන්නයට පෙර අතිරේක ආහාර භෝග ලෙස මුං වගාව කරන්නේ නම් මෙම මස අවසන් වීමට පෙර වගාව කලයුතු බව පෙන්වා දෙන ලදී. | |
| 06 | කාන්තා අනු කමිටු සහ වියලි ගොවිපල කලාපය | කාන්තා අනු කමිටු සඳහා ගම්මිරිස් වගාව ව්‍යාප්ත කිරීම,ගෙවතු වගාව දිරිගැන්වීම,ගොඩ ඉඩම් සංවර්ධනය සඳහා අඹ සහ අන්නාසි වගා ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡා කරන ලදී.<br>වාරිමාර්ග කළමනාකරණ අංශය හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය ඒකාබද්ධව 50 % දායකත්වය යටතේ අඹ පැල ලබාදීමට සැළසුම් කර ඇති බව දැන්විය.<br>මේ සඳහා ගොවිසංවිධාන මට්ටමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීමට කමිටුවේ එකගතාවය පලවිය. | නේ.ව්‍යා.කළමනාකරු<br><br>ගොවීන් සුදානම් කිරීම සංවර්ධන නිලධාරීන් |
| 07 | වියලි ගොවිපල සංවර්ධන කටයුතු | අදහස් දැක්වීම - නේවාසික ව්‍යාපාර කළමනාකරු<br>මුතුකණ්ඩිය ව්‍යාපාර කමිටුව නියෝජනය සඳහා වියලි ගොවිපල ගොවිසංවිධාන වල ලිඛිත ඉල්ලීම අනුව කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන බවත් ,එසේම ලැබෙන ප්‍රතිලාභ ලබාදීමට කමිටුවේ එකග තාවය ලැබිය යුතු බවත් පැහැදිලි කරන ලදී.<br><br>ඒ සඳහා කමිටුවේ එකග තාවය හා අනුමැතිය ලබා දෙන ලදී. | ව්‍යාපාර කමිටුව |

| | | | |
|---|---|---|---|
| | | ඔවුන්ගේ පෙර වගා අත්දැකීම් පදනම් කරගෙන අඹ සහ අන්නාසි වගා ව්‍යාපෘතියත්, රබර් වගා ව්‍යාපෘතියත් මගින් ගෙවතු ඉඩම් සංවර්ධනය කිරීමත්,සත්ව පාලන ස්වයංරැකියා කටයුතු මගින් ආදායම් උත්පාදනය සඳහා යොමු කිරීම . පොකුණු සංවර්ධනය කර සුලු පරිමාන වී වගා සහ අතිරේක බෝග ව්‍යාප්ත කිරීම මූලික අරමුණු ලෙස සාකච්ඡා විය.ඒ සඳහා යක්කදූරාව හා සමනල බැද්ද යන වසම් දෙක පළමු අදියරට තෝරා ගන්නා ලදි. | නේ.ව්‍යා.කළමනාකරු, සංවර්ධන නිලධාරීන් |
| 08 | ස්තුතිය හා රැස්වීම අවසන් කිරීම | නේවාසික ව්‍යාපාර කළමනාකරු -<br>අද දින ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කර ගැනීම සඳහා සහභාගී වූ සියලුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්වින්ට සහ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්ට ස්තුතිය පල කිරීමෙන් පසු රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.<br><br>මී ලග ව්‍යාපාර කමිටු රැස්වීම 2017.09.28 දින පැවැත්වේ. | |

එල්.සරත් පෙම්සිරි සිල්වා
නේවාසික ව්‍යාපාර කළමනාකරු
මුතුකණ්ඩිය ව්‍යාපාරය
සියඹලාණ්ඩුව

wels